# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2015 දෙසැම්බර් මස 31 වන බ්‍රහස්පතින්දා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි

### බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.38 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ සහ බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඈ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. සකාවුල්ලා
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඩුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් සුමනසේකර
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
ඉන්දික බණ්ඩාර
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
එස්. කුහවරදන්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
තුවාන් ආමීත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් ආර්. පීරිස්
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රීවර්ණසිංහ
මහින්ද ජයසිංහ
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සරත් පතිරණ
සුනිල් වටගල
සේනක දමයන්ත ද සිල්වා
ශ්‍රීනාත් පෙරේරා

## 01. ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ :

*i*

*"කේ.සී. ලෝගේෂ්වරන් ගරු ආණ්ඩුකාරතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'අ' ව්‍යවස්ථාවේ 8(අ) ඡේදය මගින් පවරා ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය සඳහා වූ 2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය නැවත සලකා බැලීම සඳහා බස්නාහිර පළාත් සභාව 2015 දෙසැම්බර් මස 31 වන දින පෙ.ව. 09.30 ට කැඳවන මෙන් කරන ලද නියෝගය ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන කරන ලදී."*

## 02. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"බස්නාහිර පළාතේ සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරයෙන් නිශාන්ත ශ්‍රීවර්ණසිංහ මැතිතුමාව ඉවත් කළ බව අංක 1947/19 හා 2015.12.29 වන දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී."*

*ii*

*"ගරු එදිරිසිංහ ආරච්චිගේ ඉසුර දේවප්‍රිය ධර්මසේන මැතිතුමා බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා දැනට දරන අමාත්‍ය ධූරයේ කටයුතුවලට අතිරේකව පළාත් සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015 දෙසැම්බර් 29 වන දින පත් කරනු ලැබ ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී."*

*iii*

*"තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2016 ජනවාරි මස 04 වන දින පෙ.ව. 09.30 සිට පෙ.ව. 11.00 දක්වා කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ, ප්‍රධාන ලේකම් කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී."*

## 03. කාරක සභා වාර්තා :

2015.12.30 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 04. පළාත් සභාවේ කටයුතු : I

ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015.12.28 දාතමින් ගරු සභාපතිතුමා අමතා එවා ඇති අංක GOV/WP/GOV'S Corres /06 දරන ලිපියේ අඩංගු කාරණය පිළිබඳ සාකච්ඡා කිරීමට හැකි වන අයුරින් කාර්ය පටිපාටි රීති අංක 15(1), 15(4), 57(1), 57(3), 57(4), 57(5) සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 05. පළාත් සභාවේ කටයුතු : II

*"සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ සහ 2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කාර්ය පටිපාටි රීති අංක 49(3), 50(8), 50(11) හා 66(2) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."* යනුවෙන් ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

**පූර්ණ කාරක සභාව :**

*"දැන් පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය යුතු යැයි"* ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා [සභා කටයුතු අමාත්‍ය] ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

ඊට අනුකූලව, පූ.භා. 09.54 ට පළාත් සභාව, පූර්ණ කාරක සභාවක් බවට පරිවර්තනය විය.

**ශීර්ෂ අංක :**

**105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය**

**113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**116 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

*ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායක*
*ගරු මෙරිල් පෙරේරා*
*ගරු ශ්‍රීනාත් ම. පෙරේරා*
*ගරු සුමිත් ලාල් මැන්දිස් - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක*
*ගරු සුසිල් කිඳෙල්පිටිය*

*පූ.භා. 10.33 ට පූර්ණ කාරක සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.08 ට යළිත් රැස් විය.*

*ගරු ගුණසිරි ජයනාත්*
*ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක*
*ගරු මහේෂ් අල්මේදා*
*ගරු කිත්සිරි කහටපිටිය*
*ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍ය*

*ප.භා. 12.00 ට අංක 105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය අවසන් විය.*

***අනතුරුව, අංක 105, 113, 114, 115 හා 116 යන වැය ශීර්ෂයන් පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. 2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය :

*"2016 වර්ෂයේ මුදල් ප්‍රකාශය සඳහා වූ 2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳව නැවත සලකා බැලීමේදී, 2015.12.22 දින මෙම සභාවේදී සාකච්ඡා කරන ලද මුල් විසර්ජන ප්‍රඥප්තිය සංශෝධන රහිතව සම්මත කළ යුතු යැයි ද, එම තීරණය අනුව එම විසර්ජන ප්‍රඥප්තිය ආඥාපනත ව්‍යවස්ථාවේ 154 ඌ (3) අනු ව්‍යවස්ථාව අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතුය."* යනුවෙන් ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා [සභා කටයුතු අමාත්‍ය] විසින් යෝජනා කරන ලදී.

*ඊට අනුකූලව,*
***2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

**අ.භා. 12.04 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] විසින් පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය වාර්තා කරන ලදී.**

## 07. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි - ගරු සභා නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය"*

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 12.10 ට, 2016 ජනවාරි මස 05 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.12.31
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කුමා/31
Minuts 2015.12.31 - Hansard Section